09732

018/57/S-II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

උපදෙස්:

A සහ B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

(i) 60 දශකයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ නාට්‍ය **හතරක** නම් සහ ඒවායේ නිෂ්පාදකයන්ගේ නම් සඳහන් කරන්න. (ලකුණු 04

(ii) ඉහත පිළිතුරට ඔබ ලියූ නිෂ්පාදකයන් **දෙදෙනකු** පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05

(iii) 60 සහ 70 දශකවල පොදුවේ දේශීය නාට්‍ය කලාව පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 06

(i) සුබ සහ යස නාට්‍යයේ නායකයා එහි ප්‍රතිනායකයා ප්‍රිය කිරීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 04

(ii) මෙම නාට්‍යයේ නායකයා හා ප්‍රතිනායකයා අතර ගැටුමක් පවතී ද? නැති ද? විමර්ශනයක් කරන්න. (ලකුණු 05

(iii) නායක ප්‍රතිනායක චරිත දෙකින් වඩාත් විප්ලවකාරී ලෙස ඔබ සලකන්නේ කවුරුන් දැයි සඳහන් කර, එය කරුණු දක්වමින් සනාථ කරන්න. (ලකුණු 06

(i) "හස්තිකාන්ත මන්තරේ" නිෂ්පාදනය සඳහා නාට්‍යකරුවා ආභාසය ලබා ගත් රංග ශෛලි **දෙක** නම් කරන්න. (ලකුණු 04

(ii) එම රංග ශෛලි දෙකෙහි ආභාසය නාට්‍යයෙහි විද්‍යමාන වන ආකාරය පෙන්වාදෙන්න. (ලකුණු 05

(iii) 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යය විචාරයට ලක් කරන්න. (ලකුණු 06

### B - විදේශීය නාට්‍ය කලාව

(i) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ හමුවන නායක වර්ග නම් කරන්න. (ලකුණු 04

(ii) 'අභිඥානශාකුන්තලයේ' නේතෘ ඉන් කුමන වර්ගයට අයත් වන්නේ දැයි දක්වා, ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05

(iii) අවස්ථා පංචකයේ ඉෂ්ටාර්ථය සිද්ධවන අවස්ථාව හෙවත් නියතඵලප්‍රාප්තිය සිදුවන්නේ 'අභිඥානශාකුන්තලයේ' කවර අංකයේ, කවර අවස්ථාවේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06

(i) 'ජුලියස් සීසර්' නාට්‍යයේ කැසියස් ගේ **හෝ** 'ඔතෙලෝ' නාට්‍යයේ ඉයාගෝ ගේ චරිතයේ **හෝ** දුර්ගුණ **හතරක්** දක්වන්න. (ලකුණු 04

(ii) ඉන් එක් චරිතයක් තෝරාගෙන නාට්‍ය විකාශයට එම චරිතයේ ඇති වැදගත්කම පහදන්න. (ලකුණු 05

(iii) ඉහත නාට්‍ය දෙකින් එකක් තෝරාගෙන පුද්ගලයකු ගේ සිත වැරදි මාර්ගයකට පෙළඹවීමට පූර්වෝක්ත චරිත සතු හැකියාව විවරණය කරන්න. (ලකුණු 06

(i) 'ඇන්ටිගනී' නාට්‍යයේ ඇන්ටිගනී හා 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරා කිසියම් අභීෂ්ටාර්ථ දෙකක් උදෙසා සටන් වදිති. එම අභීෂ්ටාර්ථ කවරේ දැයි ඔබේ අදහස අනුව පෙන්වාදෙන්න. (ලකුණු 0

(ii) එකී අභීෂ්ටාර්ථ ඉදිරියේ ඔවුන් ගේ සාර්ථක අසාර්ථකභාවය සාකච්ඡාවට ලක් කරන්න. (ලකුණු 0

(iii) රූකඩ ගෙදර නාට්‍යයේ සියල්ල සමථයකට පත් වුව ද නෝරා ගෙදරින් පිට ව යන්නේ මන්දැ යි පහදන්න. (ලකුණු

* * *

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත